# <u>ලෝකාන්තය</u>

තිස් අට වසරකට පෙර මා සරසවියේ
කඳුරට වුවත් වැලිකතරක්සේ ගෙවියේ
අවසන් වසර මුල් භාගය ඇරඹියේ
විනෝද චාරිකාවෙනි ලෝකාන්තයේ

මහ මග අවසන්ය බස්රිය නතර විය
කුසගිනි නිවන ලෙස තුරු සෙවනකට විය
ආහර පාර්සල් බඳුනත් විවර විය
මා සිටියේ එහි පෝලිම කෙළවරය

මා අත ගියේ හිස් බඳුනට බව දැනුනි
ඒ බව දුටු ඈ මා වෙත නැඹුරු වුනි
ඇගෙ බත්පතට හවුලට ඇරයුම් කෙරුනි
නොකැමැත්තෙන් වුවද එය පිළිගන්ට වුනි

නව අත්දැකීමකි මින් පෙර නොසිදුවුන
දුටුවේ මුල්වරටය මා ඒ අඟන
සිතුවිලි වෙලාගති මා සිත කලඹවන
බත්පත හිස්වන්නට විය රස නොදැන

ආදර නෞකාවෙහි නැංගුරම් දමා
තිබුනලු වසර තුන හතරක් වෙවී පමා
සාමය සතුට සමගින් ඇරඹු ගමනා
දුශ්කර නමුදු ඉදිරියටම යයි මේදිනා

නිසල සයුරකට ඒ නැව පිවිසේවා
මුල් පෙම අවසන් පෙම ලෙස පවතීවා
දරුවන් සේම මුනුබුරුනුත් බිහි වේවා
තෙරුවන් බලෙන් අප සැමහට සෙත් වේවා

හිඹුටානේ ජයසිරි විජේරත්නගේ අතීත අත්දැකීමක්
2003 - 09 -13